**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 10 ශ්‍රේණිය - පිළිතුරු පත්‍ර**

## පිළිතුරු පත්‍රය I

| | | | |
|---|---|---|---|
| 1. iv | 11. ii | 21. iii | 31. iii |
| 2. iii | 12. i | 22. iv | 32. iii |
| 3. i | 13. iv | 23. ii | 33. iv |
| 4. ii | 14. iii | 24. I | 34. ii |
| 5. iii | 15. iii | 25. iv | 35. i |
| 6. iv | 16. ii | 26. ii | 36. ii |
| 7. ii | 17. iv | 27. I | 37. iv |
| 8. i | 18. i | 28. iv | 38. ii |
| 9. iv | 19. iv | 29. iii | 39. iv |
| 10. iii | 20. i | 30. i | 40. iii |

(1 x 40 = 40)

1. i. සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍යය, ග්‍රහකයා

   ii. ප්‍රවෘත්ති අංශය, වැඩසටහන් අංශය, දැන්වීම් අංශය,

   iii. මණ්ඩලික මාධ්‍යවේදීන්, ප්‍රාදේශීය මාධ්‍යවේදීන්,

   iv. රජයට හිතකරව කටයුතු කරන මාධ්‍ය,
   රජයට එරෙහිව කටයුතු කරන මාධ්‍ය
   සමබරව කටයුතු කරන මාධ්‍යය

   v. අර්ථ බාධක, මාධ්‍ය බාධක

   vi. දැන්වීම් අංශය

   vii. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
   ලක්හඬ ගුවන්විදුලි සේවය

   viii. ප්‍රවෘත්තිවලට අදාළව ඡායාරූප සැපයීම

   ix. මුදල් වටිනාකමක් සහිතව මුද්දර මුද්‍රාවක් මුද්‍රණය කිරීමයි.

   x. Google, Yahoo

2. i. අඩු පිරිවැය, ආකර්ෂණීය නිමාව, ඉක්මන් බව, පහසුව, කාර්යක්‍ෂමතාව

   ii. අඩු පිරිවැය - සාමාන්‍ය මුද්‍රණ කටයුත්තක් සමග සාපේක්ෂව බැලූ විට පරිගණක ආශ්‍රිත ප්‍රකාශනය ඉතා අඩු පිරිවැයක් සහිතය.

   ආකර්ෂණීය නිමාව - පරිගණකය සතු පරිගණක අකුරු යෝජනයේ සහ පිටු සැලසුමේ කිරීමේ පහසුව නිසා නිමාව ආකර්ෂණීය කර ගැනීමට පදනම සැකසේ.

   ඉක්මන් බව - එක් සම්මන්ත්‍රණයක තොරතුරු සම්මන්ත්‍රණය අවසානය වී සහභාගී වූවන් විසිරයාමට පෙර මූලික වාර්තාවක් සියලු දෙනා අතට පත් කළ හැකිය.

   පහසුව - පහසුව වඩාත් කැපී පෙනෙන්නේ සාමාන්‍ය මුද්‍රණ ක්‍රම සමඟ සැසඳීමෙනි.

   කාර්යක්ෂමතාව - ඉක්මනින් සකස් කරගත හැකි නිසා කාර්යක්ෂමතාවය වැඩිය.

iii. අත් පිටපත සැකසීම, අකුරු යෝජනය හා පිට සැලසුම් කිරීම, මුද්‍රණය හා පිටපත්කරණය, නිමි කටයුතු

iv. ඡායාපිටපත්කරණයට වඩා වෙනස් ක්‍රමයකට අනුපිටපත් මුද්‍රණය කිරීමක් අනුපිටපත් කරණයෙන් සිදුවේ. එනම් ඩිජිටල් අනුපිටපත්කරණයේ දී, එක් වතාවකට එක් පිටුවක් සකස්කර තමන්ට අවශ්‍ය අනුපිටපත් ප්‍රමාණය ලබා ගත හැකිවීම.

3. i. සිතීම විධිමත් කිරීම, සැබෑව හඳුනාගැනීම, දැනුම සංරක්ෂණය, පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම, වාචික ප්‍රකාශනය, කාලය සන්නිවේදනය


ii. උච්චාරණය, අර්ථ ගැන්වීම, යෝග්‍යතාව (කෙටියෙන් විස්තර කර තිබිය යුතුය.)

iii. තනිදාමය, ඕපදූප දාමය, සම්භාවිතා දාමය, පර්ෂද දාමය (රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කර තිබිය යුතුය.)

iv. සංවිධානයක් තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ප්‍රධාන ආකාර තුනකි.

- ඉහල සිට පහළට සන්නිවේදනය
- පහළ සිට ඉහළට සන්නිවේදනය
- හරස් සන්නිවේදනය

(මෙය ඕනෑම සංවිධානයකට අදාලව රූප සටහනක් දැක්විය හැකිය. උදා: පාසල)




4. i. තොරතුරු සැපයීම, අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය ලබාදීම, පෙළඹවීම, සමාජානුයෝජනය, සංවාද සහ සාකච්ඡා, සංස්කෘතික ප්‍රගමනය, ඒකාබද්ධතාවය.

ii. කෙනෙකුගේ පංචේන්ද්‍රීය මගින් ලැබෙන විවිධ සන්දේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම සංජානනයයි.

iii. • සන්දේශය තුළ විවිධාර්ථ තිබීම.
• වැරදි ලෙස තොරතුරු ගොනුකර සන්දේශ සැකසීම.
• සන්දේශයේ තොරතුරු විකෘති වී තිබීම.
• ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැලපීම.

iv. • අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය.
• අන්තර් පුද්ගල සන්නිවේදනය.
• සමූහ සන්නිවේදනය.
• ජන සන්නිවේදනය.

5. i. 1979 වර්ෂයේදීය

ii. භූගෝලීයව කොතැනක හෝ සිදුවන ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති තොරතුරක් රූප මාධ්‍යයෙන් ලබා ගැනීම ප්‍රවෘත්ති අංශයේ කාර්යයයි.

iii. • රාජ්‍ය හිමිකම සහිත ගුවන් විදුලි සේවා.
• මහජන සංවිධාන හිමිකම සහිත ගුවන් විදුලි සේවා.
• පෞද්ගලික ව්‍යාපාර හිමිකම සහිත ගුවන් විදුලි සේවා.

iv. ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙනත් රැකියාවක් කරන අතර හෝ වෙනත් රැකියාවක් කරමින් සිට විශ්‍රාම ගෙන හෝ මාධ්‍ය ශ්‍රමිකයෙක් ලෙෂ යම් බල ප්‍රදේශයක තොරතුරු වාර්තා කිරීම මොවුන්ගේ කාර්ය වේ.
මාණ්ඩලික මාධ්‍යවේදීන් වෘත්තීය මාධ්‍යවේදීන් වේ. එම ජනමාධ්‍ය ආයතනයේ මාසික වැටුප් ලබන මාධ්‍ය ශ්‍රමිකයන්ය. මොවුන් විසින් ආයතනය තුළ හෝ ආයතනය විසින් යොදවන මාධ්‍ය කාර්යයක් ඉටුකිරීමට සේවය කළ යුතුය.

6. i. ලේඛනය යනු භාෂාවේ දෘෂ්‍ය ස්වරූපයයි.

ii. • එහි ව්‍යාකරණය තිබේ.
• අක්ෂර වින්‍යාසය තිබේ.
• අකුරුවලට හැඩයක් තිබේ.
• විරාම ලක්ෂණ යෙදිය යුතුය.
• ලේඛනයේදී වචන ඈත් කර ලිවිය යුතුය.
• එක් වාක්‍යයක් තවත් වාක්‍යයකින් වෙන් කර දැක්විය යුතුය.
• එක් ජේදයක් තවත් ඡේදයකින් වෙන් කර දැක්විය යුතුය.

iii. සාහිත්‍යමය ලේඛනවලදී භාෂාව සෞන්දර්යාත්මකව හා නිර්මාණශීලීව යොදා ගැනේ. එහෙත් රාජකාරී ලිපිවලදී යොදාගන්නේ එයටම ආවේනික වූ භාෂා රටාවකි.

iv. 
- පොත්පත් කියවීම.
- විවිධ කරුණු යටතේ ලියවුණු ලිපි අධ්‍යයනය කිරීම.
- විවිධ කරුණු යටතේ ලිපි ලිවීම.
- පාසලේ සමිති වල වාර්තා ලිවීම.
- පාසලේ ප්‍රවෘත්ති පුවත්පත් වලට ලියා යැවීම.
- නිර්මාණාත්මක කෙටිකතා, කවි, නිසඳැස් ලිවීම.

7. i. අර්ථබාධක (Semantic Noice)
මධ්‍ය බාධක (Media Noice)

ii. අර්ථ බාධක යන්නෙන් අදහස් වන්නේ සන්නිවේදකයා විසින් එවන ලද සංදේශය ග්‍රහණය කරගත හැකි නමුත්, එය ඒ ආකාරයෙන්ම අර්ථ ගැන්වීමට ග්‍රාහකයන් නොහැකි වීමට ඇතිවන බාධකයයි.

මාධ්‍ය බාධක යන්නෙන් තාක්ෂණික බාධක අදහස් වේ. එනම් සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා සන්දේශය ගමන් කිරීමට යොදා ගන්නා මාධ්‍යයේ කුමන හෝ ස්ථානයකදී, එම ගමනට ඇතිවිය හැකි යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන බාධක මාධ්‍ය බාධක ලෙස සැලකේ.

iii. චක්‍රීය ආකෘතිය, දාම ආකෘතිය, මයි ආකෘතිය, රෝද ආකෘතිය (රූප සටහන් ඇසුරින් පැහැදිලි කළ යුතුය.)

iv. විධිමත් සන්නිවේදනයේදී, එය සමාජ අවශ්‍යතාවයක් වන අතර, එහිදී සන්නිවේදකයා වූ කලී සන්නිවේදන සැලසුම් කර ක්‍රියාත්මක කරන්නා වශයෙනි. එම නිසා සන්නිවේදකයා දක්ෂ විය යුතුය.

අවිධිමත් සන්නිවේදනයේද සමාජ අවශ්‍යතාවයක් වුවත්, එයට අයත් වන කටකතා, කේලාම්, ඕපාදූප ආදිය සමාජයට අහිතකර ලෙස බලපාන නිසා, එයින් ලැබෙන සන්දේශ ග්‍රහණය කරගන්නා බුද්ධිමත් ග්‍රාහකයෙක් විය යුතුය.